13.අනුපාත මගින් මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය හා අර්ථකථනය කර කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම

මූල්‍ය ප්‍රකාශන වලින් සපයන තොරතුරු භාවිත කර තීරණ ගැනීමේදී එම තොරතුරු තවදුරටත් විශ්ලේෂණය කල යුතු වේ. මේ සඳහා යොදා ගන්නා එක් ශිල්පීය ක්‍රමයක් ලෙස ගිණුම්කරණ අනුපාත දැක්විය හැක.

- අනුපාතයක් යනු, යම් සාධක දෙකක වටිනාකම් අතර ඇති සම්බන්ධතාවය පෙන්නුම් කිරීම වේ.
- ගිණුම්කරණ අනුපාතයක් යනු, ගිණුම් වාර්තා වල අඩංගු යම් සාධක දෙකක වටිනාකම් අතර සම්බන්ධතාවය පෙන්නුම් කිරීමක් වේ.

අනුපාත ඉදිරිපත් කිරීමේදී භාවිතා කල හැකි ක්‍රම

- භාග සංඛ්‍යාවක් (1/5)
- අනුපූරකයක් ලෙස (5:1)
- ප්‍රතිශතයක් ලෙස (20%)

ගිණුම්කරණ අනුපාත සංසන්දනය කල හැකි ආකාර

- ව්‍යාපාරයේ අතීත තොරතුරු සමග සංසන්දනය කිරීම
- සමාන ව්‍යාපාර සමග සංසන්දනය කිරීම

තීරණ ගැනීමේ අවශ්‍යතාව මත අනුපාත වර්ගීකරණය



1. ද්‍රවශීලතා අනුපාත

ව්‍යාපාරයක කෙටිකාලින ණය පියවීමේ හැකියාවත් එදිනෙදා ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට ව්‍යාපාරයට ඇති මූල්‍ය ශක්තියත් මැනීම සඳහා යොදා ගනු ලබනඅනුපාත වේ.මේ සඳහා යොදාගනු ලබන අනුපාත වනුයේ,

1. ජංගම අනුපාතය
2. ක්ෂණික අනුපාතය

1 ජංගම අනුපාතය

ජංගම වත්කම් / ජංගම වගකීම්	හෝ	ජංගම වත්කම් : ජංගම වගකීම්

ගණනය කිරීමේ අරමුණ,

ජංගම වගකීම් පියවීමට ජංගම වත්කම් වලට ඇති හැකියාව මෙමගින් පෙන්නුම් කෙරේ.

යෝග්‍ය අනුපාතය 2:1 වේ. 2ට වඩා අඩුවුවහොත් ද්‍රවශීලතා ගැටළු (කෙටිකාලින බුන්වත්වීම) ඇතිවිය හැක.

2.ක්ෂණික අනුපාතයාතය

ද්‍රවශීල වත්කම් / ජංගම වගකීම්	හෝ	ද්‍රවශීල වත්කම් : ජංගම වගකීම්

ද්‍රවශීල වත්කම් = ජංගම වත්කම් - (අවසන් තොග + ඉදිරියට ගෙවූ වියදම්)

ගණනය කිරීමේ අරමුණ,

ජංගම වගකීම් පියවීමට ද්‍රවශීල වත්කම් වලට ඇති හැකියාව මෙමගින් පෙන්නුම් කෙරේ.

යෝග්‍ය අනුපාතය 1:1 වේ.

උදාහරණ :

2022/03/31 අවසන් වර්ෂය සඳහා ඔදරාගේ ව්‍යාපාරයේ හා තරගකරි ව්‍යාපාරයක් වන ශෂිනිගේ ව්‍යාපාරයේ 2022/03/31 දිනට පහත තොරතුරු සපයා ඇත.

	ඔදාරා	ශෂිනි
ඉතිරි බඩු තොගය	60,000	70,000
වෙළඳ ලැබියයුතු දෑ	30,000	40,000
ඉදිරියට කල ගෙවීම	10,000	15,000
වෙළඳ ගෙවිය යුතු දෑ	42,000	53,000
උපචිත වියදම්	28,000	22,000

මුදල් හා මුදල් සමාන දෑ	40,000	10,000

1. එක් එක් ව්‍යාපාර සඳහා පහත අනුපාත ගණනය කරන්න.
    a. ජංගම අනුපාතය
    b. ක්ෂණික අනුපාතය
2. ද්‍රවශීලතාවය අතින් වඩා කාර්යක්ෂම ව්‍යාපාරය කුමක්ද ?

පිළිතුර

	ඔදරාගේ ව්‍යාපාරයේ	ශෂිනිගේ ව්‍යාපාරයේ
ජංගම අනුපාතය <u>මුළු වත්කම්</u> මුළු වගකීම්	2 (140,000/70000)	1.8 (135000/75000)
ක්ෂණික අනුපාතය <u>ද්‍රවශීල වත්කම්</u> මුළු වගකීම්	1 (70,000/70000)	0.67 (50000/75000)

<u>2.තෝලන අනුපාත</u>

තෝලනය යනු ව්‍යාපාරයක ණය ප්‍රාග්ධනය හා හිමිකම් ප්‍රාග්ධනය අතර ඇති සම්බන්ධතාවය වේ. මෙහිදී අවස්ථා තුනක් යටතේ තෝලනය හඳුනා ගත හැකිය.

ණය ප්‍රාග්ධනය> හිමිකම් ප්‍රාග්ධනය → අධි තෝලනය (යෝග්‍ය නොවේ.)

ණය ප්‍රාග්ධනය<හිමිකම් ප්‍රාග්ධනය → අව තෝලනය (යෝග්‍ය වේ.)

ණය ප්‍රාග්ධනය= හිමිකම් ප්‍රාග්ධනය → සම තෝලනය

තෝලන අනුපාත යටතේ පහත අනුපාත ගණනය කරනු ලැබේ.

1. ණය අනුපාතය
2. ණය හිමිකම් අනුපාතය
3. පොලි ආවරණ අනුපාතය

<u>1. ණය අනුපාතය</u>

මුළු ප්‍රාග්ධනය ණය ප්‍රග්ධනයෙන් කවර ප්‍රතිශතයක් ගනීද යන්න මැනීම සඳහා ණය අනුපාතය යොදා ගනී.

<u>ණය ප්‍රාග්ධනය</u> x 100

මුළු ප්‍රාග්ධනය

ණය ප්‍රාග්ධනය= දිගුකාලින ණය

හිමිකම් ප්‍රාග්ධනය-= සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය+ සංචිත

මුළු ප්‍රාග්ධනය= ණය ප්‍රාග්ධනය+ හිමිකම් ප්‍රාග්ධනය

යෝග්‍ය අනුපාතය 0.5 (50%) වඩා අඩු (0.5 ට වඩා වැඩි නම් දිගුකාලීනව බුන්වත් විය හැකිවේ.

2ණය හිමිකම් අනුපාතය

ණය ප්‍රාග්ධනය හා හිමිකම් ප්‍රාග්ධනය අතර සම්බන්ධතාවය මෙහිදී ගණනය කෙරේ..

ණය ප්‍රාග්ධනය : හිමි ප්‍රාග්ධනය හෝ

$$\frac{\text{ණය ප්‍රාග්ධනය}}{\text{හිමි ප්‍රාග්ධනය}}$$

හිමි ප්‍රාග්ධනය = සා. කොටස් ප්‍රාග්ධනය + සංචිත

යෝග්‍ය අනුපාතය 1 (100%) වඩා අඩු (100% ට වඩා වැඩි නම් දිගුකාලීනව බුන්වත් විය හැකිවේ

3 පොලී ආවරණ අනුපාතය

ණය සඳහා පොලිය ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් ලාභයක් ආයතනය විසින් උපයා ඇත්ද යන්න මෙහිදී ගණනය කෙරේ.

$$\frac{\text{බදු පෙර ලාභය} + \text{පොලිය}}{\text{පොලිය}}$$

යෝග්‍ය අනුපාතය : අනුපාතය වැඩි අගයක් ගැනීම යෝග්‍ය වේ.

උදාහරණ

2022/03/31 දිනට ශක්ති පොදු සමාගමේ පොත් වලින් උපුටා ගත තොරතුරු පහත දැක්වේ.

විස්තරය	රු. 000
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	8000
ප්‍රත්‍යාගණන සංචිතය	600
පොදු සංචිතය	300
රඳවාගත් ඉපයුම්	1100
10% බැකු ණය	2500
කාලච්ජේදයේ ශුද්ධ ලාභය	1100
අදායම් බදු වියදම්	150

2022/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. ණය අනුපාතය
2. ණය හිමිකම් අනුපාතය
3. පොලි ආවරණ අනුපාතය

පිළිතුර

ණය අනුපාතය= ණය ප්‍රාග්ධනය මුළු ප්‍රාග්ධනය	2500/12500*100=20%
ණය හිමිකම් අනුපාතය ණය ප්‍රාග්ධනය හිමිකම	2500/10000*100=25%
පොලි ආවරණ අනුපාතය බදු පෙර ලාභය+පොලිය පොලිය	(1250+250)/250= වාර 6

3.ලාභදායිත්ව අනුපාත

ආයතනයක මෙහෙයුම් කාර්යක්ෂමතාවය මැන බැලීම සඳහා යොදාගනු ලබන අනුපාත වේ.මේ යටතේ පහත අනුපාත හදුනා ගැනේ.

1. දළ ලාභ අනුපාතය
2. ශුද්ධ ලාභ අනුපාතය
3. මුලු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය
4. හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය

1 දළ ලාභ අනුපාතය

මෙහිදී ව්‍යාපාරයේ ප්‍රධාන අදායම වන විකුණුම් වලට සාපේක්ෂව දල ලාභය කොපමණද යන්න ගණනය කෙරේ.

$$\text{දළ ලාභ අනුපාතය} = \frac{\text{දළ ලාභය}}{\text{විකුණුම්}} \times 100$$

අනුපාතය වැඩි වීම යෝග්‍ය වේ.

2. ශුද්ධ ලාභ අනුපාතය

මෙහිදී ව්‍යාපාරයේ විකුණුම් වලට සාපේක්ෂව ශුද්ධ ලාභය කොපමණද යන්න ගණනය කෙරේ.

ශුද්ධ ලාභ අනුපාතය= ශුද්ධ ලාභය (බදු පෙර හෝ පසු) විකුණුම් *100

අනුපාතය වැඩි වීම යෝග්‍ය වේ.

3 මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය

මෙහිදී ව්‍යාපාරයේ මුළු වත්කම් වලට සාපේක්ෂව ලාභය කොපමණද යන්න ගණනය කෙරේ.

මුළු වත්කම් මත ප්‍රත්ලාභය= <u>බදු හා පොලි පෙර ලාභය</u> *100 මුළු වත්කම්

අනුපාතය වැඩි වීම යෝග්‍ය වේ.

<u>4.හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය</u>

අයිතිකරුවන්ගේ ස්කන්ධයට ලබන ලාභයේ ප්‍රතිශතය ගණනය සඳහා මෙම අනුපාතය යොදා ගනී.

හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය = <u>කාලච්ඡේදයේ ලාභය</u> X 100 **හිමිකරුගේ ප්‍රාග්ධනය හා සංචිත**

අනුපාතය වැඩි වීම යෝග්‍ය වේ.

උදාහරණ

2022/03/31 දිනට මෙවන්ගේ පොදු සමාගමේ පොත් වලින් උපුටා ගත තොරතුරු පහත දැක්වේ.

විස්තරය	රු. 000
මුළු විකුණුම්	5000
විකුණුම් පිරිවැය	2800
මෙහෙයුම් වියදම් (පොලි වියදම් රු.200,000 ඇතුළුව)	1200
බදු පෙර ලාභය	1000
බදු	200
කලච්ඡේදයේ ශුද්ධ ලාභය	800
මුළු වත්කම්	20000
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	10500
ප්‍රත්‍යාගණන සංචිතය	400
පොදු සංචිතය	600
රඳවාගත් ඉපයුම්	1000

2022/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. දළ ලාභ අනුපාතය
2. ශුද්ධ ලාභ අනුපාතය
3. මුලු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය
4. හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය

පිළිතුර

	රු. 000
1.	$$\text{දළ ලාභ අනුපාතය} = \frac{\text{දළ ලාභය}}{\text{විකුණුම්}} \times 100$$ 2200/5000*100=44%
2	ශුද්ධ ලාභ අනුපාතය= ශුද්ධ ලාභය (බදු පෙර හෝ පසු) / විකුණුම් *100 1000/5000*100=20%
3.	මුළු වත්කම් මත ප්‍රත්ලාභය= බදු හා පොලී පෙර ලාභය / මුළු වත්කම් *100 (1200/20000*100=6%
4	මුළු හිමිකමට ප්‍රතිලාභ අනුපාතය= වර්ෂය සඳහා ලාභය බදු පසු / හිමිකම *10 0 800/12500*100=6.4%

4. ක්‍රියාකාරී අනුපාත.

ව්‍යාපාරයක ඇති වත්කම් කොපමණ කාර්යක්ෂමතාවයකින් ප්‍රයෝජනයට ගෙන ඇත්ද යන්න ක්‍රියාකාරී අනුපාත මගින් මනිනු ලැබේ. ආයතනයක ක්‍රියාකාරිත්වය මැනීම සඳහා පහත අනුපාත භාවිත කරයි.

01. තොග පිරිවැටුම් අනුපාතය.
02. තොග රැඳවුම් කාලය.
03. ණයගැති පිරිවැටුම් අනුපාතය.
04. ණය එකතු කිරීමේ කාලය.

01. <u>තොග පිරිවැටුම් අනුපාතය.</u>

වර්ෂයක් තුල ව්‍යාපාරයක වෙළෙඳ තොගය කොපමණ වේගයකින් මුදල් බවට පත්වේද යන්න මෙම අනුපාතයෙන් පෙන්නුම් කරයි.

$$\text{තොග පිරිවැටුම් අනුපාතය.} = \frac{\text{විකුණු භාණ්ඩ වල පිරිවැය.}}{\text{සාමාන්‍ය තොගය}}$$

- සාමාන්‍ය තොගය $= \dfrac{\text{ආරම්භක තොගය} + \text{අවසාන තොගය}}{2}$

- තොග පිරිවැටුම් අනුපාතය වාර ගනනක් ලෙස පෙන්වයි.

ඉහල තොග පිරිවැටුම් අනුපාතයකින් , තොගය අධික වේගයකින් විකුණුම් බවට පත්වන බව පෙන්නුම් කරයි.

එමනිසා,

- දෛනික ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය මුදල් සපයාගත හැකි වීම.
- තොග යල්පනිමට ඇති ඉඩකඩ අඩුවීම.

වැනි යහපත් තත්වයන් හඳුනා ගත හැකිය.

02 <u>තොග රැඳවුම් කාලය.</u>

තොගය ව්‍යාපාරයේ ගබඩාව තුල කොපමණ කාලයක් රැඳී තිබේද යන්න මෙම අනුපාතයෙන් පෙන්වයි.

$$\text{තොග රැඳවුම් කාලය} = \frac{\text{කාලච්ඡේදයේ දින ගනන.} \quad (365)}{\text{තොග පිරිවැටුම් අනුපාතය}}$$

- තොග රැඳවුම් කාලය පෙන්වන්නේ දින ගණනක ලෙසය.

අඩු තොග රැඳවුම් කාලයක් පෙන්වීම් යෝග්‍ය වන අතර , තොගය ඉක්මනින් විකුණුම් බවට පත්වන

බව පැහැදිලි කරයි

එමනිසා ,

- ලාභ ඉපයීමට ඇති ඉඩකඩ වැඩි වීම .
- තොග පවත්වාගෙන යාමේ වියදම් අඩුවීම.
- තොග හානි සහ තොග යල්පැනීම් සඳහා ඇති ඉඩකඩ අඩු වීම.

වැනි යහපත් තත්වයන් හඳුනාගත හැකිය.

උදා 01. පහත තොරතුරු හංසකගේ ව්‍යාපාරයට අදාල වේ.

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා - දල ලාභය රු 6000 000 කි.

2022.03.32 දිනට තොගය රු 50 000කි.

අමතර තොරතුරු,

1. වර්ෂය සඳහා දළ ලාභ ප්‍රතිශතය 25%කි.
2. වර්ෂයේ වැඩ කරන දින 360 කි.
3. 2021.04.01 දිනට තොගය රු 70 000කි.

අවශ්‍ය වන්නේ ,

1. තොග පිරිවැටුම් අනුපාතය.
2. තොග රැඳවුම් කාලය.

පිළිතුර,

1. තොග පිරිවැටුම් අනුපාතය. $= \dfrac{\text{විකුණූ භාණ්ඩ වල පිරිවැය.}}{\text{සාමාන්‍ය තොගය}}$

$= \dfrac{1\ 800}{60}$

$=$ 30 වාර

විකුණුම් පිරිවැය $= \dfrac{600 \times 75}{25} = 1800$

සාමාන්‍ය තොගය $= \dfrac{\text{ආරම්භක තොගය} + \text{අවසාන තොගය}}{2}$

$= 70 + 50 / 2$

$= 60$

2. තොග රැඳවුම් කාලය. $= \dfrac{360}{\text{තොග පිරිවැටුම් අනුපාතය}}$

$= \dfrac{360}{30}$

$=$ 12 දින

උදා: 02. සීමාසහිත දූලින පොදු සමාගම පිළියෙළ කල මූල්‍ය ප්‍රකාශන වලින් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

ලාභාලාභ ප්‍රකාශනය . (රු 000)	2021 .03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2022.03.31. දිනෙන් අවසන් වර්ෂය සඳහා
විකුණුම්	6 000	7 200
විකුණුම් පිරිවැය	(4 000)	(4 800)
දල ලාභය	2 000	2 400

- පෙර වැඩ,

විකුණුම් පිරිවැය.

2021.04.01 තොගය	160	280
ගැනුම්	4 080	4640
	4 240	4 920
2022.03.31 හොගය	(240)	(120)
	4 000	4 800

- ව්‍යාපාරය වැඩකරන දින 360ක් ලෙස උපකල්පනය කරන්න.

අවශ්‍ය වන්නේ, 2022.03.31 සහ 2021 03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ,

I. තොග පිරිවැටුම් අනුපාතය.
II. තොග රැඳවුම් කාලය.
III. තොගය කාර්යක්ෂම ලෙස භාවිත කර ඇති වර්ෂය කුමක්ද ?

පිළිතුර		රු 000	රු 000
		2021 .03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2022.03.31. දිනෙන් අවසන් වර්ෂය සඳහා
I. තොග පිරිවැටුම් අනුපාතය	= විකුණු භාණ්ඩ වල පිරිවැය. / සාමාන්‍ය තොගය	= 4 000 / 200	= 4 800 / 200
		= 20 වාර	= 24 වාර
II. තොග රැඳවුම් කාලය	= 360 / තොග පිරිවැටුම් අනුපාතය	= 360 / 20	= 360 / 24
		= 18 දින	= 15 දින

III. තොගය 2021 03 31 දිනෙන් අවසන් වර්ෂයේ දී කාර්යක්ෂම ලෙස භාවිත කර ඇත.

03 ණයගැති පිරිවැටුම් අනුපාතය.

වර්ෂය තුල ණය ගැතියන් කොපමණ වාරයක් මුදල් බවට පරිවර්තනය වන්නේද යන්න මෙම අනුපාතය ඇසුරින් ගණනය කරයි.

$$\text{ණයගැති පිරිවැටුම් අනුපාතය} = \frac{\text{ණයට විකුණුම්}}{\text{සාමාන්‍ය ණය ගැතියෝ}}$$

- සාමාන්‍ය ණය ගැතියෝ $= \frac{\text{ආරම්භක ණය ගැතියෝ} + \text{අවසාන ණය ගැතියෝ}}{2}$

- මෙම අනුපාතය පෙන්වන්නේ වාර ගණනක් ලෙසය.

ව්‍යාපාරය ණය ගැතියන් ගෙන් කොතරම් කාර්යක්ෂම ලෙස මුදල් එකතුකර ගන්නේද යන්න මෙම අනුපාතයෙන් නිරූපණය කරයි.

ණය ගැති පිරිවැටුම් අනුපාතය ඉහල අගයක් ගැනීමෙන් ණයට විකුණුම් සඳහා ලැබිය යුතු මුදල් ඉක්මනින් එකතු කරගන්නා බවත් එම නිසා,

- කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා හිතකර විම.
- මුදල් ගෙවීම ප්‍රමාදවීම, ණය නොගෙවා හැරිම නිසා ඇතිවන අලාභ අඩු කර ගැනීම.

ව්‍යාපාරයකට වාසිදායක වේ.

04. ණය එකතු කිරීමේ කාලය.

මෙම අනුපාතය මඟින් ණය ගැතියන් සිය ණය ගෙවීම සඳහා සාමාන්‍යයෙන් ගනු ලබන කාලසීමාව පෙන්නුම් කරයි.

$$\text{ණය එකතු කිරීමේ කාලය.} = \frac{\text{කලච්චේදයේ දින ගණන. (365)}}{\text{ණයගැති පිරිවැටුම් අනුපාතය}}$$

- මෙම අනුපාතය දින ගණනක් ලෙස පෙන්වයි.

ණය ගැතියන් ගෙන් මුදල් එකතු කර ගැනීමට ගතවන කාලය අඩු වීම ව්‍යාපාරකට යෝග්‍ය වේ.

මෙම අනුපාතය වැඩි වීම නිසා,

- ණය එකතු කරගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබීම.
- ගන්නා ලද ක්‍රියාමාර්ග අසාර්ථක වීම.
- ව්‍යාපාරයේ ණය ප්‍රතිපත්ති වල දුර්වලතා පැවතීම.

යනාදිය හෙළිදරව් කරගත හැකිය.

උදා: 01. සීමාසහිත සුජිත් සමාගමේ මූල්‍ය ප්‍රකාශනට අදාළ උදෘත පහත දැක්වේ.

	2021.03.31 (රු)	2022.03.31 (රු)
විකුණුම් (25% ක් අත්පිට විකුණුම්)	600 000	1000 000
ජංගම වත්කම්		
ණය ගැතියෝ	40 000	60 000

අවශ්‍ය වන්නේ,

1. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයගැති පිරිවැටුම් අනුපාතය.
11. වර්ෂයකට වැඩකරන දින ගණන 360 වේ නම්, ණය එකතුකිරීමේ කාලය.

පිළිතුර

1. $$\text{ණයගැති පිරිවැටුම් අනුපාතය} = \frac{\text{ණයට විකුණුම්}}{\text{සාමාන්‍ය ණය ගැතියෝ}} = \frac{750\ 000}{50\ 000} = \underline{\underline{\text{15 වාර}}}$$

11. $$\text{ණය එකතු කිරීමේ කාලය.} = \frac{\text{කලච්චේදයේ දින ගණන. (360)}}{\text{ණයගැති පිරිවැටුම් අනුපාතය}} = \frac{360}{15} = \underline{\underline{\text{24 දින}}}$$

උදා: 02. සීමාසහිත ධනුක හා ශනුක සමාගම් වල මූල්‍ය ප්‍රකාශන උදෘතයන් පහත දැක්වේ.

	ධනුක සමාගම	ශනුක සමාගම
	2022.03.31 (රු 000)	2022.03.31 (රු 000)
ලාභ අලාභ ප්‍රකාශනය.		
විකුණුම් (60 %ක් ණයට විකුණුම් වේ.)	1200	1000
විකුණුම් පිරිවැය	750	540

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.

තොගය	70	80
ණය ගැතියෝ	100	50

අමතර තොරතුරු,

1. 2021.03.31.දිනට ධනුක සමාගමේ තොගය රු 80 000ක් වූ අතර ණය ගැතියන් රු 60 000ක් විය.
2. 2021.03.31.දිනට ශනුක සමාගමේ තොගය රු 40 000ක් වූ අතර ණය ගැතියන් රු 50 000ක් විය.

අවශ්‍ය වන්නේ,

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ධනුක සහ ශනුක සමාගම් වලට අදාලව පහත අනුපාතයන්,

1. තොග පිරිවැටුම් අනුපාතය.
2. තොග රැඳවුම් කාලය.
3. ණය ගැති පිරිවැටුම් අනුපාතය.
4. ණය එකතුකිරීමේ කාලය
5. කාර්යක්ෂම තොග පාලන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන සමාගම කුමක්ද ?
6. සාර්ථක ණය එකතුකර ගැනීමේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන සමාගම කුමක්ද ?

පිළිතුර

	ධනුක සමාගම	ශනුක සමාගම
	රු 000	රු 000
1. තොග පිරිවැටුම් අනුපාතය.= විකුණුම් පිරිවැය / සාමාන්‍ය තොගය.	= $\frac{750}{75}$ = <u>10 වාර</u>	= $\frac{540}{60}$ = <u>9 වාර</u>
2. තොග රැඳවුම් කාලය. = කාලච්ඡේදයේ දින ගණන / තොග පිරිවැටුම් අනුපාතය	= $\frac{360}{10}$ = <u>36 දින</u>	$\frac{360}{9}$ = <u>40 දින</u>
3. ණය ගැති පිරිවැටුම් අනුපාතය. = ණයට විකුණුම් / සාමාන්‍ය ණයගැතියෝ	= $\frac{720}{80}$ = <u>9 වාර</u>	= $\frac{600}{50}$ = <u>12 වාර</u>
4. ණය එකතුකිරීමේ කාලය = කාලච්ඡේදයේ දින ගණන / ණයගැති පිරිවැටුම් අනුපාතය	= $\frac{360}{9}$ = <u>40 දින</u>	= $\frac{360}{12}$ = <u>30 දින</u>

5. කාර්යක්ෂම තොග පාලන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන සමාගම
   - සීමාසහිත ධනුක පොදු සමාගම.

6. සාර්ථක ණය එකතුකර ගැනීමේ ප්‍රතිපත්ත්යක් ක්‍රියාත්මක වන සමාගම
   - සීමාසහිත ශනුක පොදු සමාගම.

5 ආයෝජකයන්ගේ අනුපාත.

ව්‍යාපාරයක අයිතිකරුවන්ගේ මූලික පරමාර්ථය වන්නේ තම ආයෝජනය සඳහා ලැබෙන ප්‍රතිලාභය කොතෙක් ද යන්න හඳුනා ගැනීමයි. මේ සඳහා යොදාගන්නා අනුපාතයන් ආයෝජකයන්ගේ අනුපාත වේ.

මෙම අනුපාත, ව්‍යාපාරයේ පෙර වර්ෂ අනුපාත හා තරඟකාරී අනෙකුත් ව්‍යාපාරයන්හි අනුපාත සමඟ සැසඳීමෙන් තම ආයෝජනය සඳහා ප්‍රමාණවත් ඉපැයීමක් සිදුවේද යන්න හඳුනා ගැනීමට ආයෝජකයන්ට හැකියාව ලැබේ.

1. කොටසක ඉපයුම් අනුපාතය.
2. කොටසක ලාභාංශ අනුපාතය.

1. කොටසක ඉපයුම් අනුපාතය.

ව්‍යාපාරයක් වර්ෂයක් තුලදී සාමාන්‍ය කොටසක් සඳහා උපයා ඇති ලාභය මෙම අනුපාතය මගින් පෙන්වයි.

$$\text{කොටසක ඉපයුම් අනුපාතය.} = \frac{\text{කාලච්ඡේදයේ සාමාන්‍ය කොටසක් සඳහා බෙදීමට ඇති ලාභය}}{\text{සාමාන්‍ය කොටස් ගණන}}$$

මෙම අනුපාතය වර්ෂයෙන් වර්ෂය ඉහල යන සමාගම් සාර්ථක ව්‍යාපාර ලෙස හඳුනා ගත හැකි වේ. අනුපාතය වෙනස් වීම, නිකුත් කර ඇති කොටස් සංඛ්‍යාව අඩු වැඩි වීම සහ කාලච්චේදය සඳහා උපයා ඇති ලාභයේ අඩු වැඩි වීම නිසා සිදුවිය හැකිය.

2. කොටසක ලාභාංශ අනුපාතය.

ව්‍යාපාරය වර්ෂයක් තුල සාමාන්‍ය කොටසක් සඳහා කාලච්ඡේදයේ ලාභයෙන් බෙදා දී ඇති කොටසකට හිමි වූ වටිනාකම මෙම අනුපාතයෙන් හඳුනා ගනියි.

$$\text{කොටසක ලාභාංශ අනුපාතය.} = \frac{\text{වර්ෂය තුල සාමාන්‍ය කොටස් සඳහා බෙදා දී ඇති ලාභය}}{\text{සාමාන්‍ය කොටස් ගණන.}}$$

කොටසක ලාභාංශ වැඩි ආයතන වල කොටස් හිමියන් තෘප්තිමත් වන අතර ,මෙම අනුපාතය වෙනස් වීමට බලපාන සාධක කිහිපයකි.

- ලාභාංශ ලෙස බෙදා දී ඇති ලාභය අඩු වැඩි වීම.
- සමාගම නිකුත් කළ කොටස් සංඛ්‍යාව අඩු වැඩි වීම.

උදා 01. පහත තොරතුරු සීමාසහිත උදාර පොදු සමාගමට අදාළ වේ.

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය.(රු 000)

	සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිතය.	රඳවා ගත් ලාභ.	එකතුව.
2021/04/01 ශේෂය	4 000	500	2 500	7 000
මුළු විස්තීරණ ආදායම		(200)	1 500	1 300
ගෙවූ ලාභාංශ			(500)	(500)
	4 000	300	3 500	6 800

- සමාගම නිකුත් කර ඇති කොටසක වටිනාකම රු 80 කි.

අවශ්‍ය වන්නේ,

1 කොටසක ඉපයුම් අනුපාතය.
2 කොටසක ලාභාංශ අනුපාතය.

පිළිතුර :

1. කොටසක ඉපයුම් අනුපාතය. = $\frac{\text{කාලච්ඡේදයේ සාමාන්‍ය කොටසක් සඳහා බෙදීමට ඇති ලාභය}}{\text{සාමාන්‍ය කොටස් ගණන}}$

$= \frac{1\ 500\ 000}{50\ 000}$

= රු 30

2. කොටසක ලාභාංශ අනුපාතය. = $\frac{\text{වර්ෂය තුල සාමාන්‍ය කොටස් සඳහා බෙදා දී ඇති ලාභය}}{\text{සාමාන්‍ය කොටස් ගණන.}}$

$= \frac{500\ 000}{50\ 000}$

= රු 10

උදා: 02. 2021.04.10 දින ව්‍යාපාර කටයුතු ආරම්භ කල සීමාසහිත අනන්තා පොදු සමාගමට අදාළ තොරතුරු පහත දැක්වේ.

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	(රු 000)
බදු පෙර ලාභය	825
වර්ෂයේ ආදායම් බද්ද	(75)
කාලච්ඡේදයේ ලාභය.	750

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය. (රු 000)

	සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	රඳවා ගත් ලාභ.	එකතුව.
ප්‍රකාශිත ප්‍රාග්ධනය (කොටස් 20 000)	1000		1 000
මුළු විස්තීරණ ආදායම		750	750
ගෙවූ ලාභාංශ		(150)	(150)
	1 000	600	1 600

අවශ්‍ය වන්නේ,

1. කොටසක ඉපයුම් අනුපාතය.
2. කොටසක ලාභාංශ අනුපාතය.

පිළිතුර :

1. කොටසක ඉපයුම් අනුපාතය. $= \dfrac{\text{කාලච්ඡේදයේ සාමාන්‍ය කොටසක් සඳහා බෙදීමට ඇති ලාභය}}{\text{සාමාන්‍ය කොටස් ගණන}}$

$= \dfrac{750\ 000}{20\ 000}$

$=$ රු 37.5

2. කොටසක ලාභාංශ අනුපාතය. $= \dfrac{\text{වර්ෂය තුල සාමාන්‍ය කොටස් සඳහා බෙදා දී ඇති ලාභය}}{\text{සාමාන්‍ය කොටස් ගණන.}}$

$= \dfrac{150\ 000}{20\ 000}$

$=$ රු 7.50

සාරාංශය

- මූල්‍ය ප්‍රකාශන වල ඇති මූල්‍ය තොරතුරු විශ්ලේෂණය කිරීම හා අර්ථකථන කිරීම සඳහා යොදාගනු ලබන ශිල්පීය ක්‍රමය ගිණුම්කරණ අනුපාත වේ.
- ගිණුම්කරණ අනුපාත පහත අරමුණු වල ප්‍රමාණවත් බව හඳුනාගැනීම වෙනුවෙන් පිළියෙල කරයි.
    - ලාභදායිත්වය
    - ද්‍රවශීලතාව
    - ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය
    - මූල්‍ය ස්ථාවරත්වය
    - ආයෝජනය
- ඉහත එක් එක් අරමුණු සඳහා ගණනය කළ අනුපාත කිහිපයක් ඇති විට තීරණ ගැනීමට හොඳම අනුපාතය පහත පරිදි හඳුනා ගත හැක.
    - ලාභදායිත්වය අනුපාත
        - දළ ලාභ අනුපාතය
        - ශුද්ධ ලාභ අනුපාතය
        - හිමිකම් ඉපයුම් අනුපාතය
        - මුළු වත්කම් ප්‍රතිලාභ අනුපාතය

        මෙම අනුපාතය සියල්ලම ගණනය කර ඇති විටක දී ලාභදායිත්වය පිළිබඳ සමස්ත නිගමනය මුළු වත්කම් ප්‍රතිලාභ අනුපාතයට අනුව ඉදිරිපත් කිරීම වඩාත් උචිත වේ.

    - ද්‍රවශීලතාව අනුපාත
        - ජංගම අනුපාතය
        - ක්ෂණික වත්කම් අනුපාතය

        ක්ෂණික වත්කම් අනුපාතය ට අනුව සමස්ත නිගමනය හඳුනා ගැනීම උචිත වේ.

    - ක්‍රියාකාරි අනුපාත
        - තොග පිරිවැටුම් අනුපාතය
        - තොග රැඳවුම් කාල අනුපාතය
        - වෙළඳ ලැබිය යුතු දෑ පිරිවැටුම් අනුපාතය(ණයගැති පිරිවැටුම් අනුපාතය)
        - වෙළඳ ලැබිය යුතු දෑ රැඳවුම් කාල අනුපාත(ණය එකතු කිරිමේ කාලය)

        සමස්ත ද්‍රවශීලතාවය පිළිබඳ ව තොග පිරිවැටුම් අනුපාතයට අනුව නිගමනය ඉදිරිපත් කිරීම උචිත වේ.

    - තෝලන අනුපාත හෙවත් මූල්‍ය ස්ථාවරත්ව අනුපාත
        - ණය අනුපාතය
        - ණය හිමිකම් අනුපාතය
        - පොලි ආවරණ අනුපාතය

        සියල්ල ගණනය කර ඇති විටකදී සමස්ත නිගමනය ණය හිමිකම් අනුපාතය ට අනුව ප්‍රකාශ කිරීම උචිත වේ.

    - ආයෝජන අනුපාත
        - කොටසක ඉපයුම් අනුපාතය
        - කොටසක ලාභාංශ අනුපාතය

        සමස්ත නිගමනය කොටසක ඉපයුම ට අදාළව තීරණ ගැනීම උචිත වේ.

ගිණුම්කරණ අනුපාත ඉදිරිපත් කරන ආකාරය මතක තබා ගැනිම සදහා පහත ගැලිම් සටහන උපකාරි වේ.

ගිණුම්කරණ අනුපාත

- ප්‍රතිශත ලෙස ඉදිරිපත් වන අනුපාත
    - ❖ දළ ලාභ
    - ❖ ශුද්ධ ලාභ
    - ❖ මුළු වත්කම් වලට ප්‍රතිලාභ
    - ❖ හිමිකමට ප්‍රතිලාභ(හිමිකම් ඉපයුම්)
    - ❖ ණය අනුපාතය
- ප්‍රතිශත ලෙස ඉදිරිපත් නොවන අනුපාත
    - වාර වලින් ප්‍රකාශ වන අනුපාත
        - ❖ තොග පිරිවැටුම්
        - ❖ ණයගැති පිරිවැටුම්
        - ❖ පොලි ආවරණ
    - වාර වලින් ප්‍රකාශ නොවන
        - දින
            - ණය එකතු කිරීම් කාලය
            - තොග රැදවුම් කාලය
        - දින නොවන
            - ජංගම අනුපාතය
            - ක්ෂණික අනුපාතය
            - කොටසක ඉපයුම
            - කොටසක   ලාභාංශ
            - ණය හිමිකම් අනුපතය

<u>අනුපාත විශ්ලේෂණය තුළින් ලැබෙන ප්‍රයෝජන</u>

- අනාගත මූල්‍ය තත්ත්වය,ලාභදායිත්වය, ද්‍රවශීලතාව යනාදිය ඇස්තමේන්තු කළ හැකි වීම.
- දිගුකාලීන නුබුන්වත්භාවය හඳුනාගත හැකි වීම.
- වර්තමාන ව්‍යාපාර තත්ත්වය පිළිබඳ ඇගයීමක් කළ හැකි වීම.
- ආයෝජකයන්ගේ තීරණ සඳහා අවශ්‍ය තොරතුරු ලබාගත හැක.
- ව්‍යාපාර මෙහෙයුම් ක්‍රියාකාරිත්වයේ කාර්යක්ෂමතාවය හඳුනාගත හැක.
- යෝග්‍ය තීරණ ගැනීමට මඟ පෙන්වීම සිදු කරයි.

<u>අනුපාත විශ්ලේෂණය සිදු කළ හැකි ආකාරය.</u>

- ව්‍යාපාරයේ අතීත තොරතුරු සමග සැසදිම.
- තරගකාරී ව්‍යාපාර තොරතුරු සමග සැසදිම.
- කර්මාන්තයේ තොරතුරු සමග සැසදිම.

<u>අනුපාත අනුව තීරණ ගැනීම</u>

- ➢ දළ ලාභ
- ➢ ශුද්ධ ලාභ
- ➢ මුළු වත්කම් වලට ප්‍රතිලාභ
- ➢ හිමිකමට ප්‍රතිලාභ
- ➢ තොග පිරිවැටුම්
- ➢ ණය ගැති පිරිවැටුම්
- ➢ පොලී ආවරණ

❖ *පහත අනුපාතයන් සදහා ලැබෙන පිළිතුර අඩු අගයක් ගැනීම ව්‍යාපරයට හිතකරවේ.*

- ➢ ණය එකතු කිරීම් කාලය
- ➢ තොග රැදවුම් කාලය

- ➢ ජංගම අනුපාතය
- ➢ ක්ෂණික අනුපාතය
- ➢ කොටසක ඉපයුම
- ➢ කොටසක   ලාභාංශ

❖ *ඉහත අනුපාතයන් සදහා ලැබෙන පිළිතුර ඉහළ අගයක් ගැනීම ව්‍යාපරයට හිතකරවේ.*

- ණය හිමිකම් අනුපතය
- ණය අනුපාතය

පුනරීක්ෂණය ගැටලු

1) සීමිත මයුර සමාගමේ 22/3/31 න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ තොරතුරු පහත ඔබ වෙත දී ඇත .

i. 22/3/31 න් අවසන් වර්ෂයේ ආදායම් ප්‍රකාශය

විකුණුම්	800,000
විකුණුම් පිරිවැය	(450,000)
දල ලාභය	350,000
වෙනත් ආදායම්	-
බෙදාහැරීමේ වියදම්	(80,000)
පරිපාලන වියදම්	(40,000)
වෙනත් වියදම්	(30,000)
මූල්‍ය වියදම්	(20,000)
බදු පෙර ලාභය	180,000
බදු	(30,000)
වර්ෂයේ ලාභය	150,000

ii. 22/3/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් උපුටා ගැනීම්

ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය රු 300,000
රඳවා ගත් ඉපයුම් රු 200,000
ජංගම නොවන වත්කම රු 600,000
ජංගම වත්කම් රු 200,000
වෙළෙඳ ලැබිය යුතු දැ රු 20,000 (21/4/1 වෙළෙඳ ලැබිය යුතු දැ රු 80,000)

iii. සාමාන්‍ය තොගය රු 90,000 (21/4/1 තොග 80,000)

iv. සියලු විකුණුම් ණය පදනමට සිදු කරයි.

v. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය වියදම් ලෙස දක්වා ඇත්තේ21/4/1 දින 10% පොලී අනුපාතය යටතේ ලබා ගත් බැංකු ණය සඳහා පොලිය වේ (වෙනත් දිගුකාලීන ණය නැත)
.

ඔබ විසින් 22/3/31 න් අවසන් වර්ෂය සඳහා

a. ණයගැති පිරිවැටුම් අනුපාතය
b. තොග රැඳවුම් කාලය
c. මුළු වත්කම් ප්‍රතිලාභ අනුපාතය
d. ණය හිමිකම් අනුපාතය
e. ක්ෂණික වත්කම් අනුපාතය යන අනුපාතයන් ගණනය කරන්න
f. මුළු වත්කම් ප්‍රතිලාභ අනුපාතය වැඩි කරගැනීම සඳහා යෝජනා දෙකක් ඉදිරිපත් කරන්න
g. වට්ටමකට යටත්ව ව්‍යාපාර ණය හිමියන් ට මුදල් පියවන ලද්දේ නම් ගණනය කරන ලද ක්ෂණික අනුපාතයට කුමක් සිදුවේද?

2) සීමිත රජරට පොදු සමාගම 22/3/31 න් අවසන් ප්‍රථම ගිණුම් වසර සඳහා පහත සඳහන් අනුපාත ගණනය කර ඔබ වෙත දී ඇත .

ජංගම අනුපාතය 1.5 : 1
තොග පිරිවැටුම් අනුපාතය වාර 8
කොටසක ඉපයුම රු 8.00

දළ ලාභ අනුපාතය 60%

අතිරේක තොරතුරු

a. 22/3/31 දිනට ජංගම වගකීම් රු 30,000 යි එදිනට ඉතිරි තොගය රු 25,000 යි
b. 22/3/31 දිනට ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය රු 200,000 යි (කොටසක ප්‍රතිශ්ටාව රු 20/=)
c. 22/3/31 දිනට මුළු වත්කම් රු 380,000 යි
d. වසර තුළ ලාභාංශ ගෙවීමක් හෝ සංචිත ප්‍රාග්ධනිත කිරීමක් හෝ නැත .
e. බදු නිදහස් සමාගමකි .

ඔබ විසින් ,

(අ)

i) ක්ෂණික අනුපාතය

ii) 22/3/31 න් අවසන් වර්ෂය සඳහා විකුණුම් ආදායම

iii) 22/3/31 න් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය

iv) ණය හිමිකම් අනුපාතය ගණනය කරන්න

v) ව්‍යාපාරයේ තෝලනය හෙවත් දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳව ඔබගේ නිගමනය හේතුවක් සහිතව ලියන්න

(ආ)

මෙම ව්‍යාපාරය හා තරගකාරී ව්‍යාපාරයක ගනනය කල අනුපාත පහත ඔබ වෙත දී ඇති නම් එම ව්‍යාපාරය සමග මෙම ව්‍යාපාරයේ අනුපාත සසදා ව්‍යාපාරයේ,

ද්‍රවශීලතාව

ලාභදායිත්වය

ව්‍යාපාර ක්‍රියාකාරිත්වය යන අංශ සඳහා ඔබගේ නිගමන හේතුවක් සහිතව ලියන්න .

<u>තරගකාරී ආයතනය ගනනය අනුපාත</u>

ක්ෂණික අනුපාතය	0.2 : 1
ණය හිමිකම් අනුපාතය	0.40
තොග පිරිවැටුම් අනුපාතය	වාර 6

3) සීමිත කුමුදිනී පොදු සමාගම විසින් පහත දත්ත ඔබ වෙත දී ඇත.

වසරේ ගැනුම්	රු .480,000
වසර තුළ සිදු වූ නිමි තොග වල ශුද්ධ අඩු වීම	රු 120,000
කාලච්ඡේදයේ විකුණුම්	රු 1000,000
වෙනත් ආදායම්	රු .100.000

පොලී හැර අනෙකුත් මෙහෙයුම් වියදම්	රු .200,000
කාලච්ඡේදයේ බදු	රු .20,000
10% බැංකු ණය	රු .300,000 (21/4/1 දින ලබාගෙන ඇත)

21/4/1 දිනට

ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	රු 300,000
රඳවාගත් ඉපයුම්	රු 150,000

- **22/3/31 න් අවසන් වසර තුළ ලාභාංශ ගෙවීම් හෝ සංචිත ප්‍රාග්ධනිත කිරීමක් හෝ සිදු වී නැත .**

ඔබ විසින් ,
i දල ලාභ අනුපාතය
ii පොලී ආවරණ අනුපාතය
iii ශුද්ධ ලාභ අනුපාතය
iv ණය අනුපාතය ගණනය කරන්න

v ඔබ ගණනය කළ අනුපාතයට අනුව **22/3/31** න් අවසන් වසර සඳහා මෙම ව්‍යාපාරයේ දිගුකාලීන මූල්‍ය හැකියාව පිළිබඳව ඔබගේ අදහස් හේතු සහිතව ඉදිරිපත් කරන්න

4) සීමිත මුතුමල් සමාගම 22/3/31 න් අවසන් වසර සඳහා පහත තොරතුරු ඔබ වෙත දී ඇත .

a) ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය (රු)

විකුණුම්	1 600,000
විකුණුම් පිරිවැය	(430,000)
දල ලාභය	11 70,000
වෙනත් ආදායම්	------
බෙදාහැරීමේ වියදම්	(310,000)
පරිපාලන වියදම්	(300,000)
වෙනත් වියදම්	(---------)
මූල්‍ය වියදම්	(30,000)
බදු පෙර ලාභය	530,000
බදු	(50,000)
වර්ෂයේ ලාභය	480,000
වෙනත් විස්තීරණ ආදායම්	
ඉඩම් ප්‍රත්‍යාගණන වෙනස් වීම්	(200000)
මුළු විස්තීරණ ආදායම	280,000

b) 21/4/1 දිනට හා **22/3/31** දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයෙන් උපුටා ගැනීම් (රු)

	22/3/31	21/4/1
තොග	120,000	70,000
වෙළෙඳ ලැබිය යුතු	150,000	50,000
කලින් ගෙවීම්	80,000	20,000
මුදල්	150,000	80,000
ප්‍රකාශිත ප්‍රාග්ධනය	2000,000	1500,000
(සා කොටසක ප්‍රතිශ්ටාව 200)		

රදවා ගත් ඉපයුම්	480,000	160,000
පොදු සංචිතය	20,000	20,000
ජංගම බැරකිරීම්	130,000	100,000

c) 22/3/31 න් අවසන් වසර සඳහා ශුද්ධ ලාභය ගනනය කිරිමේදී පහත අඩු පාඩු සිදු වී ඇති බව සොයා ගන්නා ලදී

i සලකා බලන වසරේ ඉඩම් ප්‍රත්‍යාගණන අලාභ 200,000 යි. ඉකුත් වසරේ මෙම දේපළ වලට අදාළ ප්‍රත්‍යාගණන ලාභය රු 140,000 යි.කෙසේ වුවද මුළු අලාභය වෙනත් විස්තීරණ ආදායම තුලින් ගලපා ඇත.

ii 21/4/1 දින ලබාගත් 10% බැංකු ණය 500,000 සඳහා ගෙවන ලද පොලිය පමණක් මූල්‍ය වියදම් ලෙස ගලපා ඇත.

d) සියලු ගැනුම හා විකුණුම් ණය පදනම මත සිදුවේ .
e) වසර තුළ ලාභාංශ ගෙවා ඇති අතර සංචිත ප්‍රාග්ධනිත කිරීම හා පොදු සංචිතය ට මාරු කිරීම සිදු කර නැත.
f) කාලච්ඡේද බදුවල කිසිදු වෙනසක් සිදු නොවේ .

ඔබ විසින් ,

i. ශුද්ධ ලාභ අනුපාතය
ii. ණයගැති පිරිවැටුම් අනුපාතය
iii. ණය එකතු කිරීමේ කාලය(දින ගණන 360)
iv. ක්ෂණික වත්කම් අනුපාතය
v. කොටසක ඉපයුම් අනුපාතය
vi. කොටසක ලාභාංශ අනුපාතය
vii. පොලී ආවරණ අනුපාතය ගණනය කරන්න.
viii. 21/3/31 න් අවසන් වර්ෂය සඳහා ක්ෂණික අනුපාතය ගණනය කර ව්‍යාපාරයේ වර්තමාන ද්‍රවශීලතාව පිළිබඳව ඔබගේ අදහස් හේතු සහිතව දක්වන්න.
ix. ක්ෂණික අනුපාතය ඉහල යැම ද්‍රවශීලතාවයට හිතකර වුවත් ලාභදායිත්වය ට අහිතකර විය හැක.ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද,නැද්ද යන්න හේතු සහිතව දක්වන්න.

5) අ.

ගිණුම්කරණ අනුපාත සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශය සත්‍ය ද /අසත්‍ය ද(T/F) යන්න දක්වන්න

a. අවසන් දිනට තොග ගණනය කිරීමේදී රු 50,000 ක් වටිනා තොග අත්හැරී ඇත. මෙය නිවැරදි කිරීම තුළින් ක්ෂණික අනුපාතය වැඩි වේ . ( )
b. වෙළෙඳ ගෙවිය යුතු දැ ශේෂය පියවීම තුළින් 2: 1 ලෙස පැවති ජංගම අනුපාතය වැඩි වේ.( )
c. සංචිත ප්‍රාග්ධනිත කිරීම තුළින් ණය අනුපාතය වෙනස් නොවේ .
d. ලාභාංශ ගෙවීම තුළින් ශුද්ධ ලාභ අනුපාතය අඩු වේ.
e. පොලි ආවරණ අනුපාතය ඉහල යැම තුලින් ණය සැපයුම්කරුවන් ගේ සුරක්ෂිත බව තහවුරු කරයි .
f. තොග පිරිවැටුම් අනුපාතය අඩු වීම තුළින් තොග රැඳවුම් කාලය අඩු වේ.

ආ.

නිවැරදි වරණය තෝරා අංකය වරහන් තුළ ලියන්න

a) ලාභදායිත්වය හඳුනා ගැනීම සඳහා භාවිතා නොකරන අනුපාතයේ වන්නේ

i. ශුද්ධ ලාභ අනුපාතය
ii. පොලිය ආවරණ අනුපාතය
iii. හිමිකමට ඉපයුම් අනුපාතය
iv. මුළු වත්කම් ප්‍රතිලාභ අනුපාතය
v. දළ ලාභ අනුපාතය ( )

b) ද්‍රවශීලතාවය හඳුනාගැනීමට උචිත අනුපාතය වන්නේ

i. තෝලන අනුපාතය
ii. කොටසක ඉපයුම් අනුපාතය
iii. ණය අනුපාතය
iv. ක්ෂණික වත්කම් අනුපාතය
v. ශුද්ධ ලාභ අනුපාතය ( )

c) දිගු කාලීන මූල්‍ය ස්ථාවරත්වය හඳුනාගැනීම සඳහා උචිත අනුපාතය වන්නේ

i. ණය එකතු කිරීමේ කාලය
ii. දළ ලාභ අනුපාතය
iii. ණය හිමිකම් අනුපාතය
iv. කොටසක ලාභාංශ අනුපාතය
v. ක්ෂණික වත්කම් අනුපාතය ( )

d) ව්‍යාපාරයේ ලාභදායිත්වය වැඩි කරගැනීම සඳහා උචිත යෝජනාවක් නොවන්නේ

i. විකුණුම් මිශ්‍රණයන් හඳුන්වාදීම
ii. වෙනත් ආදායම් වැඩි කර ගැනීම.
iii. බැංකු ණය වැඩිපුර ගැනීම
iv. මෙහෙයුම් වියදම් අඩුකර ගැනීමට කටයුතු කිරීම.
v. විකුණුම් ආදායම වැඩිකර ගැනීම ( )

e) ව්‍යාපාරයක ණය හිමිකම් අනුපාතය 1 ට වඩා අඩු වීම සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර වන්නේ,

i. අධි තෝලනය කි
ii. අව තෝලනකි.
iii. තෝලනය ට බලපෑමක් නැත.
iv. දිගු කාලීන මූල්‍ය ස්ථාවරත්වයට අහිතකර බලපෑමක් ඇති කරයි.
v. වැඩිපුර ණය ලබාගෙන ඇති බව ප්‍රකාශ කරයි. ( )

පුනරීක්ෂණ ගැටළු සඳහා පිළිතුරු

1)

> ණයගැති පිරිවැටුම් අනුපාතය = ණයට විකුණුම් / සාමාන්‍යය ණයගැතියෝ

i. = 800,000 / 50,000

= වාර 16

> තොග පිරිවටුම් අනුපාතය = විකුණුම් පිරිවැය / සාමාන්‍ය තොගය

ii. = 450,000 / 90,000

= වාර 5

> මුළු වත්කම් ප්‍රතිලාභ අනුපාතය = බදු පෙර ලාභය + පොලිය / මුළු වත්කම් *100%

iii. = 180,000 + 20,000 / 800,000 *100%

= 25%

> ණය හිමිකම් අනුපාතය = ණය ප්‍රාග්ධනය / හිමි ප්‍රාග්ධනය X 100%

iv. = 200,000 / 500,000 X 100%

= 40%

v. ක්ෂණික වත්කම් අනුපාතය = ද්‍රවශීල වත්කම් : ජංගම වගකීම්

100,000 : 100,000

1 : 1

vi. වැඩිකර ගැනීමට යෝජනා

- වෙනත් ආදායම් වැඩිකිරීම
- විකුණුම් පිරිවැය අඩු කිරීම
- විකුණුම් මිශ්‍රණයන් හඳුන්වාදීම
- විකුණුම් මිල වැඩි කිරීම.

vii. වැඩි වේ.

2)

i. ක්ෂණික වත්කම් අනුපාතය = ද්‍රවශීල වත්කම් : ජංගම වගකීම්

20,000: 30,000

2: 3

ii. විකුණුම් ආදායම = 500,000

තොග පිරිවැටුම් අනුපාතය = <u>විකුණුම් පිරිවැය</u> සාමාන්‍ය තොගය 8 = <u>X</u> 25,000 200,000 = විකුණුම් පිරිවැය දළ ලාභ අනුපාතය = 60% 40% = 200,000 විකුණුම් ආදායම = <u>200,000 x 100</u> = 40 = 500,000

iii. කොටසක ඉපයුම = <u>වර්ෂයේ ලාභය</u>
කොටස් සංඛ්‍යාව
8 = <u>x</u>
10,000
80,000 = වසරේ ලාභය

iv. ණය හිමිකම් අනුපාතය = ණය ප්‍රාග්ධනය : හිමි ප්‍රාග්ධනය
70,000: 280,000
1 : 4 (0.25)

v. ණය හිමිකම් අනුපාතය 1 ට අඩු අගයක් ගන්නා බැවින් අවතෝලනයක් ඇත. එම නිසා දිගු කාලීන මූල්‍ය ස්ථාවරත්වය හිතකර වේ.

ආ.

- ද්‍රවශීලතාව
  - ක්ෂණික වත්කම් අනුපාතය 0.66 > 0.2 තරගකාරී ආයතනයේ අනුපාතයට වඩා වැඩි බැවින් මෙම ව්‍යාපාරයේ ද්‍රවශීලතාවය හිතකර වේ.
- තෝලනය
  - 0.25 < 0.40 ව්‍යාපාරයේ තෝලන අනුපාතය තරගකාරිය ආයතනයට වඩා ඇඩු වන බැවින් මෙම ව්‍යාපාරයේ අවතෝලනයක් ඇත. එම නිසා දිගු කාලීන මූල්‍ය ස්තාවරත්වය තරගකාරී ව්‍යාපාරයට සාපේක්ශව හිතකර වේ.
- ව්‍යාපාර ක්‍රියාකාරිත්වය
  - තොග පිරිවැටුම් අනුපාතය වාර 8 > වාර 6 තරගකාරී ආයතනයට සාපේක්ෂව මෙම ව්‍යාපාරයේ තොග පිරිවැටුම් අනුපාතය වැඩි බැවින් මෙම ව්‍යාපාරයේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වය ඉහළ මට්ටමක ඇත.

3)

i. දළ ලාභ අනුපාතය = $\frac{\text{දළ ලාභය}}{\text{විකුණුම් ආදායම}} \times 100$

$= \frac{400,000}{1000,000} \times 100$

= 40%

> **පෙර වැඩ**
>
> දළ ලාභය = විකුණුම් ආදායම - විකුණුම් පිරිවැය
>
> = 1000,000 - (480,000 + 120,000)
>
> = 400,000

ii. පොලි ආවරණ අනුපාතය = $\frac{\text{බදු පෙර ලාභය + පොලිය}}{\text{පොලිය}}$

$= \frac{270,000 + 30,000}{30,000}$

= වාර 10

පෙර වැඩ

දළ ලාභය	= 400,000	
වෙනත් ආදායම්	= 100,000	
	500,000	
පොලී හැඩ මෙහෙයුම් වියදම්	= (200,000)	
කාලච්ඡේද පොලිය	= (30,000)	*(300,000 *10%)*
බදු පෙර ලාභය	=270,000	

iii. ශුද්ධ ලාභ අනුපාතය = $\frac{\text{වසරේ ලාභය} \times 100}{\text{විකුණුම්}}$

$= \frac{250,000 \times 100}{1000,000}$ *(270,000 -20,000) *

= 25%

iv. ණය අනුපාතය = $\frac{\text{ණය ප්‍රාග්ධනය} \times 100}{\text{මුළු ප්‍රාග්ධනය}}$

$= \frac{300,000 \times 100}{1000,000}$

= 30 %

> **පෙර වැඩ**
>
> මුළු ප්‍රාග්ධනය = හිමි ප්‍රාග්ධනය + ණය ප්‍රාග්ධනය
>
> = 300,000 + 300,000
>
> = 150,000
>
> = 250,000
>
> 1000,000 = 700,000 + 300,000

v. ණය අනුපාතය 0.5 (50%) අඩු බැවින් අවතෝලනයක් ඇත. එය ව්‍යාපාරයේ මූල්‍ය ස්ථාවරත්වයට හිතකර වේ.

4)

i. ශුද්ධ ලාභ අනුපාතය = $\frac{\text{වසරේ ලාභය}}{\text{විකුණුම්}} \times 100$

= $\frac{400,000}{1600,000} \times 100$

= 25%

<u>පෙර වැඩ</u>	
කෙටුම්පත් ලාභය =	= 480,000
(-)	
අඩුවෙන් සටහන් වූ පොලිය	(20,000)
සටහන් නොවූ ප්‍රත්‍යාගණන අලාභය	(60,000)
නිවැරදි ශුද්ධ ලාභය	400,000

ii. ණයගැති පිරිවැටුම් අනුපාතය = $\frac{\text{ණයට විකුණුම්}}{\text{සාමාන්‍ය ණයගැතියෝ}}$

$\frac{1600,000}{100,000}$ * (150,000+50,000)

= වාර 16

iii. ණයගැති රුඳවුම් කාලය = $\frac{\text{දින ගණන}}{\text{ණයගැති පිරිවැටුම් අනුපාතය}}$

= $\frac{360}{16}$

= දින 22.5

iv. ක්ෂණික වත්කම් අනුපාතය

= ද්‍රවශීල වත්කම්: ජංගම වගකීම්

300,000: 150,000

2 : 1

<u>පෙර වැඩ</u>

22/3/31 දිනට ජංගම වගකීම්

= පවතින ජංගම වගකීම + උපචිත ණය පොලිය

130,000 + 20,000

= 150,000

v. කොටසක ඉපයුම් අනුපාතය = $\frac{\text{වසරේ ලාභය}}{\text{සාමාන්‍ය කොටස් සංඛ්‍යාව}}$

$\frac{400,000}{10,000}$ *(2000,000/200)

= රු 40/=

vi. කොටසක ලාභාංශ අනුපාතය = $\frac{\text{ගෙවූ ලාභාංශ}}{\text{සාමාන්‍ය කොටස් සංඛ්‍යාව}}$

= $\frac{80,000}{10,000}$

= රු 8/=

<u>පෙර වැඩ</u>	
ආරම්භක දිනට රඳවාගත් ඉපයුම්	=160,000
+ වසරේ ලාභය	= 400,000
	=560,000
- අවසන් දිනට රඳවාගත් ඉපයුම්	= (480,000)
ලාභාංශ ගෙවීම්	= 80,000

vii. පොලී ආවරණ අනුපාතය

= <u>බදු පෙර ලාභය + පොලිය</u>
කාලච්ඡේද පොලිය

<u>450,000 + 50,000</u> *(400,000+50000)
50,000

= වාර 10

viii. ක්ෂණික වත්කම් අනුපාතය

(21/3/31) = ද්‍රවශීල වත්කම්: ජංගම වගකීම්

130,000: 100,000

= 1.3: 1

- 22/3/31 අවසන් වසරේ ක්ෂණික අනුපාතය 2: 1 වන බැවින් ඉකුත් වර්ෂයට වඩා වර්තමාන අනුපාතය ඉහළ අගයක් ගනී.එම නිසා ඉකුත් වර්ෂයට සාපේක්ෂව ද්‍රවශීලතාවය හිතකර තත්ත්වයේ පවතී.

ix. ඔව්,

- ද්‍රවශීලතාවය ට හිතකර වුවත් මුළු වත්කම් වලින් ක්ෂණික වත්කම් වැඩිවීමෙන් ජංගම නොවන වත්කම් හෙවත් ආයෝජනය අඩු විය හැක.එම නිසා වෙනත් ආදායම් අඩු වීම හා මෙහෙයුම් වියදම් වැඩි වීම සිදු විය හැක.ඒ තුළින් ලාභය අඩු වීමට බලපෑම් කළ හැකි බැවින් ලාභදායිත්වයට අහිතකර බලපෑම් එල්ල කරයි

5) අ)

a. අසත්‍යයයි/F
b. සත්‍යයි / T
c. සත්‍යයි / T
d. අසත්‍යයයි / F
e. සත්‍යයි /T
f. අසත්‍ය / F

ආ)

a. (ii)
b. (iv)
c. (iii)
d. (iii)
e. (ii)